**ශීර්ෂය - 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව**

-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව නාවික හමුදාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නාවික හමුදාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක.

ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණ බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවේ ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සැසඳිය යුතු විය. එසේ නොවන විට යම් ශේෂ වේනම් එම ශේෂ හඳුනා ගන්නා තෙක් ජර්නල් සටහන් මඟින් එම වටිනාකම ප්‍රධාන ලෙජරයේ සංශෝධනය කළ යුතු ශේෂ වශයෙන් තබාගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. එබැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම ලෙස දක්වා තිබුණු රු.36,872,707,423 ක අගය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/ 2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීම හෝ ආපසු ගෙවීම සිදුකළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.13,262,391 ක් වූ වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 ජූලි 08 දින වන විට රාජ්‍ය ආදායමට බැර කර ඇත. |
| (ආ) | 2015 ජුනි 24 දිනැති 243/ 2015 අංක දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5.1 ඡේදය හා 5.3 ඡේදය ප්‍රකාරව ආදායමට බැර නොකර රු.6,702,483ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි. | 2015 ජුනි 24 දිනැති 243/ 2015 අංක දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5.1 ඡේදය හා 5.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 ජූලි 08 දින වන විට රාජ්‍ය ආදායමට බැර කර ඇත. |

## 1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2018 ජනවාරි 01 වන දිනට ශේෂය හා පසුගිය වර්ෂයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය අතර රු.මිලියන 17,499 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඒසීඒ - 2 (i) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.7,478,715,659 ක් වුව ද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වත්කම් අත්පත් කර ගැනීම් කිසිවක් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වීම. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් වත්කම්වල වටිනාකම රු.36,872,707,423 ක් වූ ශේෂය, ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වූ රු.70,626,649,223 ක් වූ ශේෂය සමඟ නොගැලපුණි. එබැවින් ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් ශේෂයන්හි නිරවද්‍යතාවය පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ---------------- | ------------------------------- |
| (අ) | අත්තිකාරම් 'බී' ගිණුමට අදාල සැසඳුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ පාලන ගිණුමේ ශේෂය රු.301,462,323 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.278,750,834 ක් විය. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වීම. | බොහෝ කාලයක සිට පැවත එන පාලන ගිණුම හා කේවල ශේෂ අතර වෙනසකි. මෙම වෙනස හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින අතර මෑත වර්ෂවල මෙම වෙනසට අමතරව වැඩිවීමක් සිදුවී නොමැති බව කාරුණිකව දන්වමි. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කළ සේවක ණය කාල විශ්ලේෂණය අනුව නාවික හමුදාවේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් හැර වර්ෂයකට වඩා වැඩි කාලයක් තුළ අය නොවී පවතින ණය ශේෂය රු.මිලියන 23.46 ක් වූ | ආයතන සංග්‍රහයේ **XLVII** පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව සේවක ණය අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතු වීම. | වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් අය නොවී පවතින ණය ශේෂය වන රු.22,187,681 මුදලින් මු.රෙ.109 යටතේ රු.18,699,779 ක මුදලක් කපා හැරීම සඳහා අමාත්‍යාංශයට හා මහා |

| | | | |
|---|---|---|---|
| | අතර ඉන් රු.මිලියන 22.18 ක් වසර 05 කට වඩා වැඩි කාලයක් තුළ අය නොවී පැවතුණි. එය අයවිය යුතු මුළු ණය ප්‍රමාණයෙන් සියයට 76 ක නියෝජනයක් විය. | | භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත. රු.576,480 ක මුදලක් නීත්‍යානුකූලව අය කර ගැනීමේ කටයුතු කිරීම සඳහා නීති අංශයට යොමු කර ඇත. ඉතිරි ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | අංක 262/2017 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂයේ සහ ඉදිරි වර්ෂවල විශ්‍රාම/ මරණ පාරිතෝෂික ලබා දී ඇති නිලධාරීන්ගෙන් අය විය යුතු කිසිදු ණය ශේෂයන් තම ආයතනවල අත්තිකාරම් “බී” ගිණුමේ ඇතුළත් නොවිය යුතු නමුත් 2018 වර්ෂය සඳහා වූ අත්තිකාරම් “බී” ගිණුම තුළ 2018 වර්ෂයට අදාල මිය ගිය නිලධාරීන්ගේ සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ රු.4,516,307 ක ණය ශේෂයන් විය. | අංක 262/2017 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 262/ 2017 ට අනුව සමහර ණය ශේෂයන් නිරවුල් නොවන අතර දැනටමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් චෙක්පත් අදාල ආයතනයට එවනු ලැබේ. |

**1.6.5 අග්‍රිම ශේෂය**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඒ.සී.ඒ 3 යටතේ 2018 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය රු.27,134,100 ක් වුවත් එම අගය අග්‍රිම ගිණුමේ දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතු වීම. | 2018 අප්‍රේල් 24 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව 2017 දෙසැම්බර් 31 දිනට තිබූ අග්‍රිම ශේෂය වන රු.27,134,100 ක් 2018 වර්ෂයේදී ජර්නල් සටහනක් මඟින් අග්‍රිම ශේෂය 2018 ට මාරු කරන ලදී. එබැවින් 2017 අවසන් ශේෂය 2018 අග්‍රිම ගිණුමට මාරුකළ බැවින් ආරම්භක ශේෂය නොපෙන්වන ලදී. ඉදිරියේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව මුදල් තිබෙන බවටත් නිතිපතා බිල් ලැබෙන බවටත් එම බිල් අප්‍රමාදව බේරුම් කරන බවටත් සහ සහතික වීම පිණිස බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් ද විසින් බැරකම් ලේඛන නිතිපතා පරික්ෂා කර බැලිය යුතු වුවත් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම. | පිළිතුරු දී නැත. |

### 1.6.7 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ගෙවිය යුතු බදු ලෙස රු.19,473,838 ක් පෙන්නුම් කළත් එය සනාථ කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | ගෙවීමට අදාල ලිඛිත සාක්ෂි ලබාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ගෙවිය යුතු බදු ලෙස රු.19,473,838 ක් පෙන්නුම් කරන්නේ විෂයයන් ආනයනය කිරීමේදී රේගුව මඟින් අය කරන ලද වැට් බදු පිළිබඳ තොරතුරු නිසි පරිදි නොලැබීම හේතුවෙනි. මෙම බදු මුදල් ගෙවා ඇති බවත් මේ වන විට එම තොරතුරු රේගුව මඟින් ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිසි ලෙස කරුණු සොයා බැලීමකින් පසුව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සහ නියමිත කාලවකවානුව තුළදී නිශ්චිත කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් පුනරාවර්ථන වැය විෂයයන් 18 කට අදාලව රු.131,448,677 ක ඉතිරිවීම් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 05 කට අදාලව රු.44,812,047 ක ඉතිරිවීම්, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 99 අතර පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 150 කෙරෙහි අවධානය යොමුකර වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | වර්ෂයේ අග අක් මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබුණු බැවින් ගෙවීමට නොහැකි විය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 ගිණුම් වර්ෂය තුළ භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාල වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම්/ ඇණවුම්වලට එළඹ තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.49,375,073 ක් වටිනා සම්පූර්ණ නොවූ ගිවිසුම්/ ඇණවුම් 84 ක් විය. ඒ පිළිබඳ විස්තර බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශ යටතේ හෙළිදරව් කර නොතිබුණි.<br><br>තවද, බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ එකතුව රු.3,151,988,065 ක් විය යුතු වුවත් එය රු.3,111,158,837 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් රු.40,829,228 කින් බැරකම් අඩුවෙන් දැක්වුණි. | මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය අවසානය වන විට පවතින බැරකම් පිළිබඳ විස්තර හෙළිදරව් කළ යුතු වීම. | පරිගණක දෝෂයකින් එකතුව නිවැරදිව එකතු වී නොමැත.<br><br>බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ එකතුව රු.40,829,228 ක් අඩුවෙන් සටහන් වී ඇත්තේ අමාත්‍යාංශ/ රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අදාළ වන බැරකම් හා බැඳීම්, අවසාන එකතුව සඳහා අතපසු වී ඇති බැවිනි. |

| | | |
|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සලසා ඇත්නම් දෙපාර්තමේන්තුව විසින් වැඩක්, සේවාවක් හෝ සැපයුමක් සඳහා බැඳීමකට එළඹිය යුතු වුවත් ඊට අනුකූල නොවී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිය ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් 11කට අදාලව 2018 වර්ෂය තුළදී රු.1,800,148,557 ක බැරකම්වලට බැඳී තිබුණි. | ආයතනයේ මූල්‍ය පාලනය සඳහා මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වෙනත් ආකාරයකට ප්‍රතිපාදන සලසා ඇත්නම් විනා කිසිම බැඳීමකට නොබැඳී සිටිය යුතු වීම. | පරිගණක දෝෂයකින් එකතුව නිවැරදිව එකතු වී නොමැත. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජූලි 14 දිනැති 03/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්ය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 49 කට ලබාදී තිබුණු එකතුව රු.4,795,282 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමයන් කාර්යය නිමවී මාස 01 සිට මාස 08 ක් දක්වා කාල පරාසයකින් පසුව නිරවුල් කර තිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | බිල්පත්වල තිබූ අඩුපාඩු නිරවුල් කිරීමේදී පියවීම ප්‍රමාද වූ බවත්, මිලදී ගත් විෂයයන්ගේ විවිධ විෂමතාවයන් හේතුවෙන් ඒවා නිවැරදි කර නිරවුල් කිරීමේදී ප්‍රමාද වූ බවත් එම ප්‍රමාදයන් වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා ඇත. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිකුත් කරන ලද දින සිට මාස 06 ක් ඉක්මවූ නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු.1,300,862 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිකුත් කරන ලද දින සිට මාස 06 ක් ඉක්මවූ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ ප්‍රේෂණපත් සියල්ල මේ වන විටත් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| අ) | රු.1,717,525 ක වටිනාකමින් යුත් බඳ පටි මිලදී ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (ආ) වගන්තිය හා 5.4.10 වගන්තියට අනුව භාණ්ඩ මිලදී ගැනීමේදී ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (ආ) වගන්තියේ දක්වා ඇති කරුණු සහතික වීම පිණිස ලංසුකරුවන්ගෙන් ලංසු සඳහා සුරක්ෂණයක් ලබාගත යුතු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය ප්‍රකාරව කාර්යසාධනය අසාර්ථක වන විට එයින් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා, කාර්යසාධන සුරක්ෂණයන් ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | රු.මිලියන 5 ඉක්මවන මිලදී ගැනීම් වෙනුවෙන් පමණක් සුදුසු වටිනාකමකින් යුතු ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ලබාගැනීමට කටයුතු කරන ලෙස 2015 ජුලි මස 08 වන දිනැති මාණ්ඩලික සටහන්පත මඟින් අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා විසින් උපදෙස් ලබාදී ඇති බැවින් අදාල මිලදී ගැනීම්වල ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 5 ඉක්මවා නොයන බැවින් ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ලබාගැනීමට කටයුතු කර නොමැත. |
| ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ද විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, අවස්ථා 19 කදී රු.11,659,997 ක් වටිනා වැඩ සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) සහ (ආ) වගන්තිය ප්‍රකාරව ගිවිසුමක් අත්සන් කළ යුතු වීම. | මිලදී ගැනීම් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් නොකළ බවත් මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් සිදු නොවීමට වගබලා ගන්නා ලෙස නාවිකයින් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වගන්තිය ප්‍රකාරව රු.ලක්ෂ 5 ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 14 කදී රු.20,985,359 ක් වටිනා යන්ත්‍ර හා යාත්‍රා අමතර කොටස් යනාදී මිලදී ගැනීම් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | | |
| ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 25-100 ක් අතර ප්‍රසම්පාදන කටයුතු ලංසු පරීක්ෂා කරන අදියරේ සිට කොන්ත්‍රාත්තුවට අත්සන් තබන අදියර දක්වා කාලය සති 15 ක් තුළ නිම කළ යුතු වුවත් ඒ සඳහා සති 34 ක කාලයක් ගත වී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය පරිදි අදාල කාලවකවානු අනුව ප්‍රසම්පාදන සම්පූර්ණ කළ යුතු වීම. | ප්‍රසම්පාදන කටයුතු ලංසු පරීක්ෂා කිරීමේ සිට ඇණවුම් ප්‍රදානය කරන තෙක් යම් කාල සීමාවක් ප්‍රමාද විය හැකි බවත් අනවශ්‍ය ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 05-25 ක් අතර වන ප්‍රසම්පාදන කටයුතු සති 12 තුළ අවසන් කළ යුතු වුවත් ඒ සඳහා සති 26 ක කාලය ගත වී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය පරිදි අදාල කාලවකවානු අනුව ප්‍රසම්පාදන සම්පූර්ණ කළ යුතුය. | ප්‍රසම්පාදන කටයුතු ලංසු පරීක්ෂා කිරීමේ සිට ඇණවුම් ප්‍රදානය කරන තෙක් යම් කාල සීමාවක් ප්‍රමාද විය හැකි බවත් අනවශ්‍ය ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය අනුව රු.මිලියන 05 ට අඩු ප්‍රසම්පාදනයක් සති 10 ක් තුළ ඇණවුම් නිකුත් කළ යුතු වුවත් රු.5,716,175 ක් වටිනා හිස් වැසුම් මිලදී ගැනීමේ දී සති 18 ක කාලයක් ගත වී තිබුණි. | | |

**3.2 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1995 සහ 1996 වර්ෂවල මිලදීගත් එහෙත් පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණු රු.මිලියන 239 ක් වටිනා මැෂින් තුවක්කු 101 ක් නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | අළුත්වැඩියාවන් සඳහා බාහිර ආයතන වෙත ලබා දී 2018 දෙසැම්බර් 31 වන දිනට මාස 06 ක කාලයක් ගත වී තිබුණද වටිනාකම රු.1,110,200 ක් වූ යන්ත්‍ර හා උපකරණ 12 ක් අළුත්වැඩියාවන් නිමකර ආපසු ලබා ගෙන නොතිබුණි. ඊට අමතරව අලුත්වැඩියාව සඳහා නාවික වැඩපල වෙත යොමුකළ OBM යන්ත්‍ර හා වෙනත් යන්ත්‍ර 05 ක් 2018 දෙසැම්බර් 31 වන දිනට මාස 06 සිට මාස 17 දක්වා කාලයක් ගතවී තිබුණු නමුත් අළුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා කඩිනමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම කළ යුතු වීම. | අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා නාවික හමුදාව සතු මෝටර් වාහන 12 ක් අළුත්වැඩියාවට යොමුකර 2018 දෙසැම්බර් 31 වන දිනට මාස 07 සිට මාස 30 දක්වා කාලයක් ගත වී තිබුණු නමුත් අළුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි. | මෝටර් වාහනවලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා ඉක්මණින් අළුත්වැඩියා කොට භාවිතයට ගත යුතු වීම. | අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 | අපහරණය කිරීම සඳහා කටයුතු |

| | | |
|---|---|---|
| පවතින රු.43,053,724 ක පිරිවැය වූ යාත්‍රා 03 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට නැගෙනහිර, බටහිර හා උතුර නාවික විධානයන්හි අක්‍රියව පවතින නමුත් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | කරමින් පවතී. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 (ii) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැබීමට අවශ්‍ය කටයුතු කටයුතු කළ යුතු වුවත්, එක් දිනකදී නිලධාරියකු භාරයේ රු.320,271 සිට රු.2,605,845 දක්වා විවිධ ප්‍රමාණවලින් අතරදවා ගෙන තිබුණු අවස්ථා 50 කදී මුදල් රෙගුලාසි අනුව ඇප තැබීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 (ii) අනුව කටයුතු කළ යුතු වීම. | ඇප තැබීමේ කටයුතු ගිණුම් අංශයෙන් සිදු නොකරන බවත් මුදල් ලඟ තබාගත් නෞකා හා ආයතනවල නිලධාරීන්ගෙන් මේ සඳහා පිළිතුරු ලබාගත යුතු බවත් ගිණුම් අංශය විසින් දන්වා තිබුණි. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර නාවික පෙදෙසහි රු.32,990,000 ක් වටිනා යාත්‍රාවක් වර්ෂ 02 කට අධික කාලයක සිට අක්‍රීය තත්වයේ පැවතුණි. | යාත්‍රාවලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා කඩිනමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු වීම. | අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාවික හමුදාවේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ විශේෂ ක්‍රමයට බඳවා ගත් නාවිකයින් 4900 ක අතිරික්තයක්ද, නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හා නාවිකයින්ගේ පුරප්පාඩු 7046 ක් හා සිවිල් කාර්ය මණ්ඩලයේ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 373 ක් සමඟ තෘතිය, ද්විතිය හා වෙනත් තනතුරුවල පුරප්පාඩු 427 ක් පැවතුණත් එම අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත සේවකයින් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නාවික විධාන 06 ක නිවාඩු නිකේතන 07 ක් හා උත්සව ශාලා 05 ක් පවත්වා ගෙන යනු ලබන අතර මෙම නිවාඩු නිකේතන සහ උත්සව ශාලා 2016 ජනවාරි මස සිට ලාභ ලැබීමේ අරමුණින් තොරව පවත්වා ගෙන යන බව විගණනයට දන්වා තිබුණි. අදාල නිවාඩු නිකේතන හා උත්සව ශාලා මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා නාවික නිලධාරීන් සහ සෙසු නිලයන් අනුයුක්ත කර තිබුණි. එම නාවික නිලධාරීන්ගේ සහ සෙසු නිලයන්ගේ වැටුප් හා දීමනා සඳහා ඒකාබද්ධ අරමුදලින් වැය කර තිබුණු නමුත් අදාල නිවාඩු නිකේතන හා උත්සව ශාලා සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත විගණනය සඳහා ඉදිරිපත් කිරීමට හෝ අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>කෙසේ නමුත් නිවාඩු නිකේතන සහ උත්සව ශාලාවලින් ලැබෙන ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | භාවිතා කරනු ලබන ගොඩනැගිලි හා යොදවා ඇති නිලධාරීන් හා සෙසු නිලයන් නාවික හමුදාව සතුවීම හා රජය ඒ සඳහා ඒකාබද්ධ අරමුදලේ වියදම් දරනු ලබන බැවින් රජයට ප්‍රතිලාභයක් ලැබිය යුතු වේ. | එමඟින් උපයනු ලබන ආදායම් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා උපයෝජනය කරනු ලබන හෙයින් ඒකාබද්ධ අරමුදලට මුදල් බැර කිරීමක් සිදු නොවේ. තවද, එක් එක් නාවික විධානයන් වෙත අනුයුක්ත ප්‍රාදේශීය නාවික විගණන අංශයන් මඟින් සියළුම නිවාඩු නිකේතන හා උත්සව ශාලා මාසික හා ත්‍රෛමාසිකව විගණනය කරනු ලබන අතර, වාර්ෂිකව නාවික හමුදා අභ්‍යන්තර විගණන අංශය හා බාහිර ගණකාධිකාරීවරුවන් මඟින් විගණන |

කටයුතු සිදු කරනු ලබන බව දන්වා ඇත.